## පළමුවන කියැවීම

1 රාජාවලිය 17:17-24

රාජාවලියේ පළමුවන පොතෙන් ගත් කොටසකි.

**"මෙන්න, ඔබේ පුතා ජීවත් ව සිටී."**

ඉක්බිති ගෙදර ස්වාමි දූ වූ ඒ ස්ත්‍රියගේ පුත්‍රයා රෝගාතුර විය. ඔහුගේ රෝගය කොපමණ බලවත් වී ද යත්, ඔහුගේ හුස්මගැනීම නතර විය. එවිට ඈ එලියාට කතා කොට, "දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යය, ඔබ සමග මට ඇති ආරාවුල කුමක් ද? මාගේ පාපය සිහි කරවන්නටත්, මාගේ පුත්‍රයා මරන්නටත් මා ළඟට ඔබ ආයෙහි දැ"යි ඔහුගෙන් ඇසුවා ය. ඔහු ද පිළිතුරු දෙමින්, "ඔබේ පුත්‍රයා මට දෙන්නැ"යි ඈට කියා ඇගේ තුරුල්ලෙන් ඔහු රැගෙන, තමා විසූ උඩු මහලට ගෙන ගොස් තමාගේ ම ඇඳෙහි ඔහු තැබුවේ ය. තවද, ඔහු සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින්, "මාගේ දෙවි සමිඳාණන් වහන්ස, මට නවාතැන් දුන් වැන්දඹුවගේ පුතා නැසීමෙන් ඔබ ඇයට විපත් පැමිණවූ සේක් ද?" කියා, තුන්වරක් ළමයා පිට දිගා වී සමිඳාණන් වහන්සේට යාච්ඤා කොට, "මාගේ දෙවි සමිඳාණන් වහන්ස, මේ ළමයාගේ ප්‍රාණය නැවත ඔහු තුළට පැමිණෙව්ව මැනවැ"යි කීවේ ය. සමිඳාණන් වහන්සේ එලියාගේ හඬට සවන් දුන් සේක. ළමයාගේ ප්‍රාණය නැවත ඔහු තුළට පැමිණ ඔහු ජීවත් වුණේ ය. එලියා ළමයා රැගෙන උඩු මහලින් ගෙට ගෙනවුත් ඔහුගේ මවට දී, "මෙන්න, ඔබේ පුතා ජීවත් ව සිටී"යයි කීවේ ය. ස්ත්‍රිය ද කතා කරමින්, "ඔබ දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයෙකු බව ද, ඔබේ මුඛයෙහි තිබෙන සමිඳාණන් වහන්සේගේ පණිවුඩය සැබෑ බව ද දනිමි"යි එලියාට කීවා ය.

දේව වචනය මෙසේ ය. — දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 30:1,3, 4-5, 10-12

පිළිතුර: සමිඳුනි, මම ඔබට ප්‍රශස්ති ගී ගයමි.

ගීය: ඔබ මා උසස් කළ බැවින් ද මාගේ දුක් ගැන මා සතුරන්ට ප්‍රීති වීමට නුදුන් බැවින් ද සමිඳුනි, ඔබට ප්‍රශස්ති ගී ගයමි. සමිඳුනි, ඔබ පාතාලයෙන් මා ගොඩ ගත් සේක; මා වළ පල්ලට නොයන පරිදි ඔබ මා දිවි රැකගත් සේක.

පින්වතුනි, සමිඳුන්ට ගී පසස් නගන්න; ඒ නිර්මල නාමයට තුති ගී ගයන්න. මන්ද, එතුමන්ගේ උදහස ඇසිල්ලකට පමණ ය. එතුමන්ගේ කරුණාව දිවි ඇති තාක් ය. රැයේ හැඬීම පවතියි; උදය ප්‍රීතිය උදා වෙයි.

සමිඳුනි, සවන් දී මට කරුණා කළ මැනව. සමිඳුනි, ඔබ මාගේ සරණ වුව මැනව. ඔබ මාගේ දොම්නස සොම්නසට හැරවූ සේක.

ඔබ මාගේ ගෝණි රෙදි මුදා තුටු පිළියෙන් මා සැරසූ සේක. දැන් ඉතින් මම නිහඬ ව නොසිටිමි. ඔබට ගී පසස් ගයන්නෙමි. මාගේ දෙවි ස්වාමිනි, සදහට ම ඔබ හට ගී ගයන්නෙමි.

## දෙවන කියැවීම

ගලාති 1:11-19

පාවුලු තුමන් විසින් ගලාතිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**සකල ජාතීනට දේශනා කරනු සඳහා පියාණන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන් අනාවරණය කළ සේක.**

සහෝදරවරුනි, මා දේශනා කරන සුබ අස්න මිනිසුන් විසින් නිපදවන ලද්දක් නොවන බව මම ඔබට දන්වමි. මම එය කිසි මිනිසෙකු ගෙන් නොලැබුවෙමි. කිසිවෙකු මට එය ඉගැන්නුවේත් නැත. එය මට හෙළි කළේ ක්‍රිස්තුන් වහන්සේ ම ය. මා ජුදෙව් භක්තිකයෙකු ව සිටිය දී, කිසි අනුකම්පාවක් නැති ව දෙවියන් වහන්සේගේ සභාවට පීඩා කොට, එය විනාශ කර දැමීමට වෑයම් කරමින් හැසුරුණු අන්දම ගැන ඔබ අසා ඇත. මාගේ පියවරුන්ගේ පරම්පරාගත සම්ප්‍රදායයන් කෙරෙහි උද්‍යෝගිමත් ව, මාගේ ජාතියේ සමකාලීනයන් බොහෝ දෙනෙකු පරදවා, ජුදෙව් ආගම මැනැවින් පිළිපැද්දෙමි. එහෙත් දෙවියන් වහන්සේ ස්වකීය වරප්‍රසාදයෙන් මව් කුසේ දී පටන් මා වෙන් කොට තෝරාගෙන, විජාතීන් අතර ස්වකීය පුත්‍රයාණන් ප්‍රකාශ කරන පිණිස ඒ පුත්‍රයාණන් මට එළිදරව් කිරීමට තීරණය කළ සේක. එවිට අවවාදය ලබන පිණිසත් මා කිසි පුද්ගලයෙකු වෙත ගියේ වත්, මට කලින් අපෝසතුළුවරයන් ව සිටි අය හමු වන පිණිස ජෙරුසලමට ගියේ වත් නැත. එසේ නොව, මම වහා ම අරාබියට ගොස්, පසුව දමස්කයට පැමිණියෙමි. පේදුරු හමු වීමට මා ජෙරුසලමට ගියේ තෙවසකට පසුව ය. ඔහු සමඟ පසළොස් දිනක් ගත කෙළෙමි. එහෙත් ස්වාමින් වහන්සේගේ සොහොයුරු ජාකොබ් හැර වෙන කිසි අපෝසතුළුවරයකු නුදුටුවෙමි.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

එපේසි 1:17-18

ආලේලූයා! ආලේලූයා!
අපගේ සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පියාණන් වූ, දෙවියන් වහන්සේ,
අවබෝධ කරගැනීම පිණිස, අපේ හදවත් ආලෝකවත් කරන සේක්වා.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 7:11-17

ලූක් තුමගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"තරුණය නැගිටින්න, මම අණ කරමි."**

ඉන්පසු ජේසුස් වහන්සේ නායින් නම් නුවරකට වැඩිය සේක. උන් වහන්සේගේ ශ්‍රාවකයෝ ද මහත් සමූහයක් ද උන් වහන්සේ පිරිවරා ගියහ. උන් වහන්සේ නුවර දොරටුවට ළං වූ කල, මළ මිනියක් පිටතට ගෙනෙන ලද්දේ ය. මළ තැනැත්තේ, සිය මවගේ එක ම පුත්‍රයා ය. ඈ ද වැන්දඹුවකි. නුවරවාසී විශාල පිරිසක් ඈ සමඟ ආහ. සමිඳුණන් වහන්සේ ඈ දැක අනුකම්පා කොට, "හැඬීම නවත්වන්නැ"යි වදාළ සේක. උන් වහන්සේ ළං වී දෙණට අත තැබූ සේක. එවිට දෙණ උසුලන්නෝ නැවතුණාහ. උන් වහන්සේ, "යෞවනය, නැගිටින්නැ යි මම ඔබට කියමි"යි වදාළ සේක. එවිට මළ මිනිසා නැගිට හිඳගෙන කතා කරන්න පටන්ගත්තේ ය. උන් වහන්සේ ඔහු සිය මෑණියන්ට භාර දුන් සේක. එකල සියල්ලෝ ම බිය පත් ව, "ශ්‍රේෂ්ඨ දිවැසිවරයෙක් අප අතර පහළ වී සිටියි. දෙවියන් වහන්සේ සිය සෙනඟ ගළවන්න වැඩිය සේකැ"යි කියමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ. උන් වහන්සේ ගැන මේ පුවත මුළු ජුදයෙහි ද අවට පෙදෙස්වල ද පැතිර ගියේ ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.